# පුරාණ ලංකා සමාජයේ සාපරාධී ක්‍රියා සඳහා ක්‍රියාත්මක වූ දණ්ඩන පටිපාටිය පිළිබඳ ප්‍රාථමික මූලාශ්‍රය ඇසුරෙන් කෙරෙන අධ්‍යයනයක්.

අනුරුද්ධිකා දිල්හානි-
ඉතිහාස අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය.

---

## ABSTRACT

ශිෂ්ටාචාරගත සෑම රටක මෙන් ම පැරණි ලංකාවේ ද නීතියක් සහ නෛතික ආයතන පැවැතිණි. විවිධ විෂය ක්ෂේත්‍ර යටතේ ගෙන බලන විට නීතිය පිළිබඳ එකිනෙකට වෙනස් අර්ථකථන පවතී. නීති නිඝණ්ඩුවේ "**නීතිය**" හඳුන්වා ඇත්තේ "පළමු රජ දරුවන් විසින් නියම කරන ලද ව්‍යවහාර යුක්ති නොකඩ කොට එලෙස ම පැවැත්වීම නීතිය නම් වන බවයි". පැරණි භාරතයේ නීතිය ධර්ම, චාරිත්‍ර, ව්‍යවහාර සහ රාජශාසන යනුවෙන් නීති මූල සතරකින් සකස් වී තිබූ බව කෞටිල්‍ය අර්ථශාස්ත්‍රයේ සඳහන් වේ. නමුත් පුරාතන ලංකාවේ නීතිය සකස් වී තිබුණේ චාරිත්‍ර සහ සම්ප්‍රදායන්ගේ එකතුවකිනි. නීතිය ක්‍රියාත්මක වූයේ රජු ප්‍රධාන කොට ගෙන නිසා රජු නීතියේ උල්පත ලෙස සලකන ලදී.

පුරාණ ලංකාවේ ක්‍රියාත්මක වූ දණ්ඩනය පිළිබඳව මහාවංසය, මහාවංසටීකාව, පූජාවලිය, සද්ධර්මරත්නාවලිය, සද්ධර්මලංකාරය, යුරෝපීය ලේඛකයන්ගේ වාර්තා, සහ වේවැල්කැටිය, කොණ්ඩවට්ටවන, බදුලු ටැම් ලිපිය, මොරගොඩ, ගල්පොත යනාදී සෙල්ලිපි මගින් තහවුරු වේ. මෙම මූලාශ්‍රය පරීක්ෂා කිරීමේදී පෙනී යන්නේ ඇතැම් අවස්ථාවලදී එකම වරදට දෙනු ලැබූ දණ්ඩනය විවිධාකාරී වූ බවයි. ඒ අතර ම පැරණි ම සමාජයේ ක්‍රියාත්මක වූ දණ්ඩන ක්‍රම උඩරට රාජධානිය වන විට ඇතැම් වෙනස්කම්වලට භාජනය වූ බව යුරෝපීය ලේඛකයන්ගේ වාර්තාවලින් පැහැදිලි වේ. මූලාශ්‍රයවලට අනුව පැරණි සමාජයේ මරණීය දණ්ඩනය බොහෝ විට ක්‍රියාත්මක වූයේ හිස ගසා දැමීමෙනි. නමුත් උඩරට රාජධානි සමයේ එල්ලා මැරීමෙන් නැතහොත් ඇතුන් ලවා පෑගීමෙන් මරණීය දණ්ඩනය ක්‍රියාත්මක වූ අතර ඇතැම් දඬුවම්වල ලිහිල් බවක් දක්නට ලැබේ. මේ අනුව රාජද්‍රෝහය, රාජ නියෝග කඩ කිරීම, මනුෂ්‍ය ඝාතනය, සොරකම් වැනි සාපරාධී ක්‍රියා සඳහා පුරාණ සමාජය තුළ ක්‍රියාත්මක කරන ලද දණ්ඩන පටිපාටිය සහ පසුකාලීනව එම දණ්ඩන වෙනස් වීමට බලපෑ හේතු සාධක පිළිබඳව ප්‍රාථමික මූලාශ්‍රය ඇසුරෙන් විමර්ශනය කිරීම මෙම අධ්‍යයනයේ අරමුණ වේ.